**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ සෞඛ්‍ය කාර්ය සහායක (ක්ෂේත්‍ර මදුරු මර්දන සහායක) තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය**

01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : අදාළ නොවේ

1.2 අමාත්‍යාංශය : සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

යොමු අංකය: CB/SA/බ.ගැ.ප/2009-II දිනය: 2025.01.02

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම :

යොමු අංකය: DMS/0016/052 දිනය: 2024.07.11

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය :

යොමු අංකය: EST-2/02/REC/0958 දිනය: 2024.12.19

1.5 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය

යොමු අංකය: PSC/EST/06-01-13/02/2025 දිනය: 2025.03.06

02. පත්කිරීමේ බලධරයා: රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්

03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1. සේවා ගණය : ප්‍රාථමික ශිල්පීය නොවන

3.2. ශ්‍රේණි : III,II,I සහ විශේෂ

3.3. පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය :

" ආයතනයන්හි කාර්යයන් ඉටුකිරීම හා පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය වන පොදු මූලික අවශ්‍යතාවන් අතුරින් නිශ්චිත අර්ධ ශිල්පීය හෝ ශිල්පීය නිපුණතාවකින් තොරව ඉටු කළ හැකි මූලික කාර්යයන් පවරනු ලබන බහුකාර්ය සේවා ගණයක් ලෙස මෙම සේවා ගණය සැලකේ. මෙම කාර්ය පථයනට අයත් කාර්ය අතුරින් ඕනෑම කාර්යභාරයක් දෙපාර්තමේන්තු ප්‍රධාන/ පත්කිරීම් බලධරයා විසින් මෙම සේවා ගණයට අයත් නිලධරයෙකුට පවරනු ලැබිය හැකිය. "

3.4. කාර්යය පැවරීම : ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත යෝග්‍යතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

04. තනතුරෙහි/තනතුරුවල ස්වභාවය : ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත වේ

(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.)

nq

05. වැටුප්

5.1. වැටුප් කේත අංකය : PL 01- 2016

5.2. වැටුප් පරිමාණය : රු. 24,250 – 10X250 - 10X270 – 10X300 - 12X330 - රු.36, 410

5.3. ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාල මාසික වැටුප් පියවර:

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| III | පියවර 01 | රුපියල් 24,250 |
| II | පියවර 12 | රුපියල් 27,020 |
| I | පියවර 22 | රුපියල් 29,750 |
| විශේෂ | පියවර 32 | රුපියල් 32,780 |

06. සේවා ගණයට අයත් තනතුර/තනතුරු

6.1. අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව සහ එම තනතුරුවලට පැවරෙන කාර්යයන්:

| අනුමත තනතුරු නාම | තනතුරු අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| සෞඛ්‍ය කාර්ය සහායක (ක්ෂේත්‍ර මදුරු මර්දන සහායක) | III, II, I, සහ විශේෂ | 671 | • වාර්තා වූ ඩෙංගු රෝගීන් අවට පරිශ්‍ර නිතිපතා නිරීක්ෂණය කිරීම හා මදුරුවන් බෝවන ස්ථාන හඳුනා ගෙන ඉවත් කිරීම සඳහා සහය වීම<br>• වසංගත තත්ත්වයකදී වාහක මර්දන කටයුතු සඳහා තාක්ෂණික නිලධාරින්ට සහාය වීම<br>• කිට විද්‍යා සමීක්ෂණ සිදු කිරීම සහ ක්ෂේත්‍ර නිරීක්ෂණ සඳහා සහාය වීම<br>• කීට විද්‍යාඥවරුන්ගේ රාජකාරී කටයුතු සඳහා සහාය වීම<br>• තාක්ෂණික නිළධාරින්ගේ උපදෙස් හා අධීක්ෂණය යටතේ ධූමායන කටයුතු සිදු කිරීම |

සටහන:

බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව වෙත යොමු කොට ජාතික වෘත්තීය කුසලතා 03 (NVQ 03) මට්ටමේ සුදුසුකම සම්පූර්ණ කල සේවකයින් 671 දෙනාට අමතරව නව බඳවා ගැනීම් ඉදිරියේදී සිදු නොකෙරේ.

6.2. ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : සෞඛ්‍ය කාර්ය සහායක (ක්ෂේත්‍ර මදුරු මර්දන සහායක) – 671

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යයන් සඳහා III,II,I සහ විශේෂ යන ශ්‍රේණීන් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

07. බඳවා ගැනීමේ ක්‍රමය: අමාත්‍ය මණ්ඩල ලේකම්ගේ අංක අමප/21/0173/309/013 හා 2021.02.23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව බඳවා ගැනීම් සිදු කෙරේ.

7.1 බඳවා ගැනීමේ සුදුසුකම්:

7.1.1 අධ්‍යාපන සුදුසුකම් : අදාළ නොවේ.

7.1.2 වෘත්තීය සුදුසුකම් : ජාතික වෘත්තීය කුසලතා 03 (NVQ 03) මට්ටමේ සුදුසුකම සම්පූර්ණ කල බහුකාර්ය සංවර්ධන සහායකයකු වීම.

7.1.3 පළපුරුද්ද : අදාළ නොවේ.

7.1.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.1.5 වෙනත්
I. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය

II. අයදුම්කරු විශිෂ්ය චරිතයකින් යුක්ත විය යුතුය.

III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.1 සිට 7.2 දක්වා වන සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.2 වයස

7.2.1 අවම සීමාව : අවුරුදු 18ට නොඅඩු

7.2.2 උපරිම සීමාව : අවුරුදු 45ට නොවැඩි

(පුහුණුවට බඳවා ගත් දින වන විට වයස අවුරුදු 45ට අඩු අයදුම්කරුවන්ට උපරිම සීමාව අදාළ නොවේ.)

7.3 බඳවා ගැනීමේ ක්‍රමය:

7.3.1 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

7.3.2 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව, මෙම තනතුරට පත් කරන බැවින් අයදුම්පත් කැඳවීමක් සිදු නොකරයි.

08. කාර්යක්ෂමතා කඩඉම්

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉම්ද යන වග | කාර්යක්ෂමතා කඩඉම් සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ ස්වභාවය (ලිඛිත පරීක්ෂණය/ වෘත්තීය පරීක්ෂණය/ සහතික පාඨමාලාව/වෙනත්) |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට බඳවාගෙන වසර තුනක් ගතවීමට පෙර | වාචික (ඇමුණුම 01) |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස් වී වසර තුනක් ගතවීමට පෙර | වාචික (ඇමුණුම 02) |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස් වී වසර පහක් ගතවීමට පෙර | වාචික (ඇමුණුම 03) |

8.2. කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද : අවම වශයෙන් වසරකට එක් වරක්

nd

8.3. කාර්යක්ෂමතා කඩඉම් වලට අදාල පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද :

| | |
|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම<br>2 වන කාර්යක්ෂමතා කඩඉම<br>3 වන කාර්යක්ෂමතා කඩඉම | සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින් |

09. භාෂා ප්‍රවීණතාව

9.1

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 01. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පත්වීම් දින සිට වසර තුනක් ඉකුත් වීමට පෙර ලබා ගත යුතුය. |
| 02. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව අදාල මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. |

10. ශ්‍රේණි උසස් කිරීම

10.1 III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම.

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව:

10.1.1.1. සපුරාලිය යුතු සුදුසුකම්:

I. පත්වීම ස්ථිර කර තිබීම.

II. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10)ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10)ක් උපයාගෙන තිබීම.

III. අනුමත කාර්යසාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හා ඊට අනුෂාංගික චක්‍රලේඛයන්හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගෙන තිබීම.

VI. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

සංලක්ෂය : මෙම නිලධාරීන්ට පත්වීම් ලබා දුන් දින/ වැඩ භාරගත් දින යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට උසස්වීම් සඳහා සේවා කාලය ගණනය කරනු ලැබේ.

nd

10.1.1.2. උසස් කිරීමේ ක්‍රමය : සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.2 II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම.

10.2.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව:

10.2.1.1. සපුරාලිය යුතු සුදුසුකම්:

I. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවය (09)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක නවය (09)ක් උපයාගෙන තිබීම.

II. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හා ඊට අනුෂාංගික චක්‍රලේඛයන්හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

III. අනුමත කාර්යසාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර නවය (09)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.2.1.2. උසස් කිරීමේ ක්‍රමය : සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව I ශ්‍රේණියට උසස් කිරීම සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.3 I වන ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම.

10.3.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව:

10.3.1.1. සපුරාලිය යුතු සුදුසුකම්:

I. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට සේවා ගණයේ I ශ්‍රේණියේ අවම වසයෙන් වසර නවය (09)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක නවය (09)ක් උපයාගෙන තිබීම.

II. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හා ඊට අනුෂාංගික චක්‍රලේඛයන්හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

III. අනුමත කාර්යසාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර නවය (09) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

rd

10.3.1.2. උසස් කිරීමේ ක්‍රමය: සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

සංලක්ෂය : සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

11. තනතුරුවලට පත් කිරීම: අදාළ නොවේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි : අදාළ නොවේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ: අදාළ නොවේ.

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය : අදාළ නොවේ.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන් ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 හා 2022.12.14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

16. මෙම උසස් කිරීමේ පටිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වේතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

17. අන්තර්කාලීන විධිවිධාන : අදාළ නොවේ.

සකස් කලේ :..................

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : එන්.ඒ. මුදිත විමලසේන

තනතුර : අධ්‍යක්ෂ (පාලන) IV සෞඛ්‍ය අමාත්‍යාංශය "සුවසිරිපාය" කොළඹ 10.

දිනය : 2025.03.21

පරීක්ෂා කලේ: ..................

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : නදීකා වික්‍රම ආරච්චි

තනතුර : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) 01 සෞඛ්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය"

දිනය : 2025.03.21 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..................

නම : ..................
කේ.එම්. වත්සලා ප්‍රියදර්ශනී

තනතුර අතිරේක ලේකම් (පාලන) I
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

නිල මුද්‍රාව : "සුවසිරිපාය", කොළඹ 10.

දිනය : 2025.03.22

18. අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය

යොමු අංකය : CB/SA/බ.ගැ.ප/2009-II

2025.03.06 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ සෞඛ්‍ය කාර්ය සහායක (ක්ෂේත්‍ර මදුරු මර්දන සහායක) තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කරමි.

අත්සන : ..................................................

නම: ..................................................

ලේකම්

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

දිනය : 2025/03/11

නිල මුද්‍රාව : ..................................................

19. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය

යොමු අංකය : PSC/EST/06-01-13/02/2025

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ සෞඛ්‍ය කාර්ය සහායක (ක්ෂේත්‍ර මදුරු මර්දන සහායක ) තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය 2025.03.06 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : ..................................................

නම: ඩබ්ලිව්. එච්. එම්. එම්. සී. කේ. දයාරත්න

ලේකම්,

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

දිනය : 2025/04/01

නිල මුද්‍රාව : ..................................................

ඇමුණුම -01

01. විභාගයේ නම : ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ III වැනි ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (8.1)

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| සාමාන්‍ය පරිපාලනය | පැය - 01 | 100 | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : අවම වශයෙන් වසරකට එක් වරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| පරීක්ෂණයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| සාමාන්‍ය පරිපාලනය | i. අදාල නිලධාරියා තමන් සේවය කරන ආයතනයට පැවරෙන කාර්යයන් පිළිබඳව අවශ්‍ය පරිදි දැනුම ලබා ඇත්දැයි මැන බැලීම<br>ii. සාමාන්‍ය කාර්යාල ක්‍රම හා ආයතන පරිපාලන ක්‍රමවේදයන් පිළිබඳව තනතුරට අදාල දැනුම<br>iii. තනතුරට පැවරෙන විවිධ කාර්යන් පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් හා ප්‍රවීණතාවක් අත්පත් කරගෙන ඇත්දැයි මැන බැලීම<br><br>(වාචික පරීක්ෂණයකි) |

සකස් කලේ :..................

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : එන්.ඒ. මුදිත විමලසේන

තනතුර : අධ්‍යක්ෂ (පාලන) III, සෞඛ්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය", කොළඹ 10.

දිනය : 2025-03-21

පරීක්ෂා කලේ: ..................................

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : ... වික්‍රම ආරච්චි

තනතුර : නියෝජ්‍ය අ... (පාලන) 01, සෞඛ්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය", 385 පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10.

දිනය : 2025.03.21

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..................................

නම : කේ.එම්. වත්සලා ප්‍රියදර්ශණී

තනතුර : අතිරේක ලේකම් (පාලන) I, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය", කොළඹ 10.

දිනය : 2025-03-22

නිල මුද්‍රාව : ..................................

ඇමුණුම -02

01. විභාගයේ නම : ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ II වැනි ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (8.1)

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි | පැය - 1 1/2 | 100 | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : අවම වශයෙන් වසරකට එක් වරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| පරීක්ෂණයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි | i. ආයතන සංග්‍රහයේ හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ පහත කරුණු<br><br>වෘත්තීය සමිති කටයුතු, මාරු කිරීම, දේශපාලන හිමිකම්, අතිකාල, ගමන් වියදම්, වැටුප් ණය, විනය පිළිබඳ කරුණු<br><br>ii. මුදල් රෙගුලාසි සංග්‍රහයේ පහත කරුණු<br><br>බලය දීම, අනුමත කිරීම, සහතික කිරීම, ගෙවීම, පාඩුව හා අත්හැර දැමීම.<br><br>(වාචික පරීක්ෂණයකි) |

සකස් කලේ :..........................................

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

එන්.ඒ. මුදිත විමලසේන

නම : අධ්‍යක්ෂ (පාලන) IV

තනතුර : සෞඛ්‍ය අමාත්‍යාංශය "සුවසිරිපාය" කොළඹ 10

දිනය : 2025.03.21

පරීක්ෂා කලේ: ..........................................

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නදීකා වික්‍රම ආරච්චි

නම : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) 01

සෞඛ්‍ය අමාත්‍යාංශය,

තනතුර : "සුවසිරිපාය"

385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,

දිනය : 2025.03.21 කොළඹ 10.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..........................................

නම : ..........................................

තනතුර : කේ.එම්. වත්සලා ප්‍රියදර්ශනී අතිරේක ලේකම් (පාලන) I

දිනය : 2025.03.22

නිල මුද්‍රාව : සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය "සුවසිරිපාය", කොළඹ 10.

ඇමුණුම -03

01. විභාගයේ නම : ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ I වැනි ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (8.1)

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| විෂය දැනුම | පැය - 1 1/2 | 100 | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : අවම වශයෙන් වසරකට එක් වරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| පරීක්ෂණයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| විෂය දැනුම | වාර්තා වූ ඩෙංගු රෝගීන් අවට පරිශ්‍ර නිතිපතා නිරීක්ෂණය කිරීම, මදුරුවන් බෝවන ස්ථාන හඳුනා ගැනීම, වසංගත තත්ත්වයකදී වාහක මර්දන කටයුතු සිදු කිරීම, කීට විද්‍යා සමීක්ෂණ සිදු කිරීම, ක්ෂේත්‍ර නිරීක්ෂණ සිදු කිරීම, ධූමායන කටයුතු සිදු කිරීම හා සාමාන්‍ය ආයතනික කටයුතු යන ආදී විෂයයන් ආවරණය වන සේ සකස් කල වාචික පරීක්ෂණයකි. |

සකස් කලේ :..........................................

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : එච්.ඒ. මුදිත විමලසේන

තනතුර : අධ්‍යක්ෂ (පාලන) III, සෞඛ්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය", කොළඹ 10.

දිනය : 2025.03.21

පරීක්ෂා කලේ: ..........................................

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : නදීකා වික්‍රම ආරච්චි

තනතුර : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) 01, සෞඛ්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය", 385 පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10.

දිනය : 2025.03.21

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..........................................

නම : ..........................................

තනතුර : කේ.එම්. වත්සලා ප්‍රියදර්ශණී, අතිරේක ලේකම් (පාලන) I

නිල මුද්‍රාව : සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය", කොළඹ 10.

දිනය : 2025.03.22